## දරුවන් උදෙසා බයිබලයක්

# සියල්ල දෙවියන් වහන්සේ මැවූ විට



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus

සකස්කරන්නා: Bob Davies; Tammy S.

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2012 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

අපව මැව්වේ කවුද? බයිබලය සහ දේව වචනය මිනිස් ජාතියේ ආරම්භය කෙසේද කියා පවසයි. කලකට පෙර දෙවියන් වහන්සේ පළමු මනුෂ්‍යයා මවා ඔහුට ආදම් යැයි නම් තැබූ සේක.



දෙවියන් වහන්සේ, මනුෂ්‍යයා වන ආදම් පොළොවේ දූවිල්ලෙන් සෑදූ සේක. ඔහුට දෙවියන් වහන්සේ ජීවන හුස්ම හෙළූ සේක. එවිට මනුෂ්‍යයා ජීවමාන ප්‍රාණයක් විය. මෙම මනුෂ්‍යයා ඒදන් නම් ඉතා අලංකාර උයනක වාසය කළේය.



දෙවියන් වහන්සේ ආදම් මැවීමට පෙර ඉතා මනහර දෙයින් පිරුණු ලස්සන ලෝකයක් මවනු ලැබුවා. පියවරෙන් පියවර කඳුවැටි ද, නිල් තණ බිම් ද, සුවඳ මල් ද, උස් ගස් කොළන් ද ලස්සන පියාපත් ඇති කුරුල්ලන් සහ හඬ නගන මීමැස්සන් ද, දියේ සෙල්ලම් කරන තල්මසුන් සහ ලිස්සා යන ගොළුබෙල්ලන්

ද මැවූ සේක.



පටන්ගැන්මෙහිදී දෙවියන් වහන්සේ
කිසිවක් මැවීමට ප්‍රථම දෙවියන් වහන්සේ
හැර කිසිවක් තිබුණේ නැත. මිනිස්සු,
ස්ථාන, ද්‍රව්‍යයන් තිබුණේ නැත.
කිසිවක් නැත. ආලෝකය හා
අන්ධකාරය නොතිබිණි.
ඉහළ දේ සහ පහළ
දේ නොතිබිණි. ඊයේ
හෝ හෙට දවසක්
නොවීය. ආරම්භයක්
නැත්තා වූ දෙවියන් වහන්සේ
පමණක් සිටි සේක. පසුව උන්
වහන්සේ ක්‍රියා කළ සේක.



පටන්ගැන්මේදී දෙවියන් වහන්සේ අහසත්
පොළොවත් මැවූ සේක.

පොළොව පාළුව, හිස්ව
තිබුණා. ගැඹුර පිට
අන්ධකාරය විය. එවිට
දෙවියන් වහන්සේ
කතාකර එළිය
වේවා යි
කී සේක.



ආලෝකය විය. දෙවියන් වහන්සේ ආලෝකයට දවාල කියා ද අන්ධකාරයට රාත්‍රිය කියා ද නම් තැබූ සේක. සවස ගතවිය. උදය උදාවිය. ඒ පළමු වන දවසය.



දෙවන දවසේ දෙවියන් වහන්සේ සාගරය, මුහුද, ඇළ දොල අහස යට පිළිවෙළින් රැස් කළ සේක. තුන් වන දවසේ ගොඩබිම මතු වේවා යි කී විට එලෙස විය.



දෙවියන් වහන්සේ නිල් තණකොළ, මල් වර්ග, පඳුරු සහ ගස්වැල්
හට ගැනේවා යි වදාළ සේක. ඒවා ඇති විය,
සවස ගතවිය. උදය උදාවිය.
ඒ තුන් වන දවසය.



ඉන්පසු ඉරත් හඳත් ගණන් කළ නොහැකි තාරකාත් මැවූ සේක. ඒවා කිසිවකුට ගණන් කළ නොහැකි විය. සවස ගත විය. උදය උදා විය.
එය සතර වන දවසයි.



මැවීමේ ලැයිස්තුවේ ඊළඟට
වූයේ මුහුදු සතුන්, මාලූන් සහ
කුරුල්ලන්ය. පස්වෙනි දවසේ
දෙවියන් වහන්සේ ලොකු
මාලු, පොඩි මාලු, දිග පාද
සහිත කොක්කු සහ ලස්සනට
සිංදු කියන කුරුල්ලන් ඇති
වන්නට සැලසූ සේක. දිය පිරි
ඇති තැන් අලංකාර කරන්නට
ලොකු මාලුන් සහ පොඩි මාලුන්
ද ගොඩබිම සහ අහස අලංකාර
කරන්නට සතුට ඇති කරන්නට
ලස්සන කුරුල්ලන් මැවූ සේක.
සවස ගත විය. උදය උදා
විය. ඒ පස් වන දවසයි.



ඉන්පසු දෙවියන් වහන්සේ නැවත කතා කළ සේක, කෘමි සත්තු, බඩ ගා යන සත්තු පණ ඇති සෑම වර්ගයේම සත්තු බිහි විය. එම සතුන් ප්‍රාණවත්ව ආහ. පොළොව දෙදරන තරමට අලි ඇතුන් සිම්පංචීන් රයිනෝසිරස් ඇතුළු විශාල සතුන්, දඟකාර වඳුරන්, හැඩිදැඩි කිඹුලන්, පණුවන්, කපටි රිළවුන්, ගාම්භීර පිරාණ, ලස්සන පූසන් ආදි හැම වර්ගයකම සතුන් එදින මැව්වා.



හය වෙනි දවසේ තවත් විශේෂ දෙයක් කළා. දැන් උන් වහන්සේ හැම දෙයක්ම සූදානම් කරල තිබුණේ මනුෂ්‍යයාටයි. මිනිසාට ප්‍රයෝජනවත් නොයෙකුත් පලාවර්ග ආහාර වර්ග පොළොවෙන් හට ගන්නට සැලැස්වූ සේක.
මිනිසාට සේවය කරන්නට ප්‍රයෝජනය පිණිස නොයෙකුත් සතුන් සිටියා.



දෙවියන්
වහන්සේ වදාළ
සේක. දෙවියන්
වහන්සේගේ
ස්වරූපයෙන්
මිනිසා මැවූ සේක.
පොළොවේ සිටින
හැම සත්ත්වයාටම
වැඩිය උසස් ලෙස
මිනිසා මැවූ සේක.
දෙවියන් වහන්සේගේ
ස්වරූපයෙන් මිනිසා
මැවූ සේක ...



දෙවියන් වහන්සේ වදාළ සේක. ''මිනිසා තනිව විසීම හොඳ නැත. ඔහුට උදව්කරන්න කෙනෙකු සිටිය යුතුයි.'' උන් වහන්සේ මැවූ සතුන් සියල්ලම ආදම් ළඟට ගෙන ආ සේක. ආදම් ඒ සතුන් සියල්ලන්ටම නම් තැබුවා. එම සතුන්ට කෙතරම් දක්‍ෂතා තිබුණත් මිනිසාට සුදුසු සහකාරියක් ඒ එක සතකු අතර වත් සිටියේ නැහැ.



දවස් හයකින් දෙවියන් වහන්සේ හැම දෙයක්ම මවා නිම කළා.
සත් වෙනි දවසට ආශීර්වාද කොට එය විවේක දවසක් කළා.



ඒදන් උයනේ ආදම් සහ ඒව: ආදම්ගේ බිරිඳ
දෙවියන් වහන්සේට කීකරු වෙමින් සතුටින් සිටියා.
දෙවියන් වහන්සේ ඔවුන්ගේ ස්වාමින් වහන්සේ,
ඔවුන්ට සපයන්නා සහ හොඳම මිතුරා වූ සේක.



සියල්ල දෙවියන් වහන්සේ මැවූ විට

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

උත්පත්ති 1-2

"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"
ගීතාවලිය 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)